**චක්‍ර ලේඛණ අංක - : 2017 / 07**

2017-01-24

සියළුම බන්ධනාගාර අධිකාරින්ට හා

සහකාර බන්ධනාගාර අධිකාරින්ට

**බන්ධනාගාර අත් අඩංගුවෙන් පැනගිය සිර හා සැකකරුවන් සම්බන්ධවයි.**

උක්ත සදහන් කරුණට අදාලව පැනයාම් සම්බන්ධයෙන් 1967-06-03 වන දින නිකුත් කර ඇති දෙපාර්තමේන්තු චක්‍ර ලේඛණ අංක කේ/ඊ/ඩබ්/පී හා පැනයාම් සම්බන්ධයෙන් මේ වන විට නිකුත් කර ඇති අනෙකුත් සියළුම චක්‍ර ලේඛණ වලට අමතර වශයෙනි.

ඒ අනුව සිර හෝ සැකකරුවකු බන්ධනාගාර අත්අඩංගුවෙන් පැනගිය අවස්ථාවකදී උක්ත සදහන් චක්‍ර ලේඛණ වලට අනුව අදාල පැනයාම සම්බන්ධයෙන් දැනුවත් කල යුතු සියළුම අංශ වෙත ඔබ විසින් දැනුවම් කිරිම සිදු කරනු ලබයි. එසේ දැනුවත් කිරීමෙන් අනතුරුව අදාල තොරතුරු ශ්‍රී ලංකා පොලිසිය මගින් පරිගණ දත්ත පද්ධතියකට( AMIS - අත්අඩංගුවට ගනු ලබන සැකකරුවන්ගේ විස්තර නියාමනය කිරීමේ ක්‍රමවේදය) ඇතුලත් කරනු ලබන අතර බන්ධනාගාර අත්අඩංගුවෙන් පැනගිය සිර හෝ සැකකරුවකු පොලිසිය මගින් නැවත අත්අඩංගුවට ගන්නා අවස්ථාවලදී උක්ත සදහන් තොරතුරු පද්ධතියෙන් අදාල පැනයාම තහවුරු කර ගැනීමට පොලිසිය විසින් කටයුතු කරනු ලබයි.

නමුත් බන්ධනාගාර අත්අඩංගුවෙන් පැන ගිය සිර හෝ සැකකරුවකු නැවත බන්ධනාගාරය වෙත පැමිණ භාර වන අවස්ථාවන් වලදී හා වෙනත් නඩු සදහා නැවත බන්ධනාගාර ගත වන අවස්ථාවන් වලදී නිළධාරීන් විසින් හදුනාගැනීමෙන් අනතුරුව හා පැනයාම සම්බන්ධයෙන් ඇලිගි සළකුණු රෙජිස්ටාර් වෙතින් කරුණු අනාවරණය කර ගැනීමෙන් අනතුරුව මෙන්ම බන්ධනාගාර නිළධාරීන් විසින් සිවිල් සමාජය තුලදී පැනගිය පුද්ගලයින් හදුනා ගැනීමෙන් අනතුරුවද නැවත බන්ධනාගාරය වෙත භාර දෙන අවස්ථාවන් වලදී අදාල අත් අඩංගුවට ගැනීම සම්බන්ධයෙන් පොලිස් දෙපාර්තමේන්තුව හා පැනයාම් සම්බන්ධයෙන් තොරතුරු ලබා දෙනු ලබන අනෙකුත් අංශ දැනුවත් කිරීමක් සිදු නොවන බව පෙනී යයි.

කරුණු එසේ හෙයින් මින් ඉදිරියට බන්ධනාගාර අත් අඩංගුවෙන් පැනගිය සිර හෝ සැකකරුවකු කුමන ආකාරයකට හෝ නැවත බන්ධනාගාර ගත වී ඔවුන් හදුනාගන්නා අවස්ථාවන් වලදී එම අත්අඩංගුවට ගැනීම හා ඒ සම්බන්ධයෙන් ඔබ විසින් ගන්නා ඉදිරි ක්‍රියාමාර්ග( පැනයාම සම්බන්ධයෙන් බන්ධනාගාර විනිශ්චය මණ්ඩලට ඉදිරිපත් කිරීමට කටයුතු කර ඇත්නම් හා පැනයාම සම්බන්ධව බන්ධනාගාර විනිශ්චය මණ්ඩලය මගින් දඩුවම් ලබා දී ඇත්නම්) සම්බන්ධයෙන් ඇගිලි සලකුණු රෙජිස්ටාර්ට හා අංක 01 හා අංක 02 පාලන කොට්ඨාශ භාර නියෝජ්‍ය පොලිස්පතිට (පාලන කොට්ඨශ අංක 01 හා අංක 02, ටොරින්ටන් චතුරශ්‍රය, කොළඹ 07) දැනුම් දීමට කටයුතු කරන ලෙසත් ඊට අමතරව දිවයිනේ සියළුම බන්ධනාගාර අධිකාරීන් හා බන්ධනාගාර මූලස්ථානය දැනුවත් කිරීමට කටයුතු කරන ලෙසත් මෙයින් දන්වා සිටිමි.

එච්.එම්.එන්.සී ධනසිංහ

බන්ධනාගාර කොමසාරිස් ජනරාල්

එච්.එම්.එන්.සී. ධනසිංහ
බන්ධනාගාර කොමසාරිස් ජනරාල්
බන්ධනාගාර මූලස්ථානය
කොළඹ - 09.